රක්‍ෂණ - වෛද්‍ය	172,709.84	165,588.55
රක්‍ෂණ - මෝටර් රථ	215,364.91	59,282.56
රක්‍ෂණ - ගිනි සහ අනෙකුත්	-	188,562.85
රක්‍ෂණ - මුදල් ප්‍රවාහනය	2,768.99	1,811.51
සේවා ගිවිසුම් - විදුලි උත්පාදක යන්ත්‍ර	-	5,922.50
සේවා ගිවිසුම් - පරිගණක	13,750.00	250,703.30
සේවා ගිවිසුම් - කාර්යාල උපකරණ	22,752.50	8,703.51
වාහන බලපත්‍ර	14,525.14	10,503.14
ප්‍රකාශන අළුත්කිරීමේ ගාස්තු	-	126,864.00
තත්ව පර්යේෂණාගාර වියදම්	1,384,868.39	126,452.88
	1,826,739.77	**944,394.80**
<u>***සටහන 9***</u>		
<u>මුදල් හා මුදලට සමාන දෑ</u>		
බැංකුවේ ඇති මුදල්	43,748,975.81	38,750,625.49
අත ඉතිරි මුදල්	-	6,500.00
	43,748,975.81	**38,757,125.49**
<u>***සටහන 10***</u>		
<u>වෙළඳ හා වෙනත් ගෙවියයුතු දෑ</u>		
වෙළඳ ණයහිමියෝ	595,380.00	495,580.00
උපචිත වියදම්	4,306,939.07	3,311,677.76
වෙන්කිරීම් සහ විවිධ ණයහිමියෝ	1,552,554.73	1,211,968.69
	6,454,873.80	**5,019,226.45**
<u>***සටහන 11***</u>		
<u>පාරිතෝෂික වෙන්කිරීම්</u>		
වසර මුල ශේෂය	20,595,948.00	16,864,572.50
අඩුකළා - වසරේ ගෙවීම්	(1,292,963.75)	(1,603,270.00)
	19,302,984.25	15,261,302.50
වසරට අදාල වෙන්කිරීම්	3,448,731.13	5,334,645.50
වසර අවසාන ශේෂය	**22,751,715.38**	**20,595,948.00**

	2011 රු.	2010 රු.
සටහන 12		
සමුච්චිත අතිරික්තය/(ඌණතාවය)		
ඉදිරියට ගෙන ආ ලාභය	(251,515,430.89)	(243,104,227.30)
පෙර වසරේ ගැලපීම් - ශේෂපත්‍රය දිනට පසුව		
අවලංගු කල චෙක්පත්		10,054.51
ප්‍රතිපූර්ණය නොකල පිඅයිපි වියදම්		(40,580.06)
පිරිත් පිංකම සඳහා වියදම් (2010 අත්තිකාරම් පියවීම)	(19,102.00)	
බැරපත් නිකුත්කිරීම් 2010	(97,414.56)	
බෝනස් දීමනා - 2010	(92,000.00)	
වෙන්කිරීම් නඩත්තු වියදම්	(1,250.00)	
අගය එකතුකිරීමේ බදු ගැලපීම්	(2,426.68)	15,060.50
අඩුවෙන් දක්වා ඇති පාරතෝෂික වෙන්කිරීම් - ජීවන වියදම් දීමනාව මත කම්කරු කොමසාරිස්ගේ දැන්වීම් පරිදි	(665,731.25)	
උපචිත වියදම් වැඩියෙන් ඇස්තමේන්තුකිරීම්	86,536.45	12,385.70
අඩුවෙන් දක්වා ඇති තැපැල් ගාස්තු - 2009	(6,500.00)	
පරිගණක අංශය සඳහා ගෙවූ අත්තිකාරම් ලියා හැරීම	(200,000.00)	
ටෙන්ඩර් තැන්පතු		500.00
ණය සහ උත්සව අත්තිකාරම් ගැලපීම්	(3,940.64)	(4,269.89)
වැඩියෙන් දක්වා ඇති ක්ෂයවීම්	735,000.00	364,108.55
අඩුවෙන් දක්වා ඇති උපචිත වියදම්	(0.01)	(27,585.83)
	(251,782,259.58)	(242,774,553.82)
වසරේ අලාභය	(3,334,684.05)	(8,740,877.07)
	(255,116,943.63)	**(251,515,430.89)**
සටහන 13		
රජයේ ප්‍රදානයන් සහ විදේශ ආධාර		
රජයෙන් ලැබුන ප්‍රාග්ධන ලැබීම්	240,731,359.65	210,731,359.65
අත්‍යන්ත්‍ර වර්ණ ගැන්වීමේ ව්‍යාපෘතිය	2,234,096.52	8,000,000.00
අමාත්‍යාංශයෙන් කරන ලද වත්කම් මාරුකිරීම්	50,043,791.25	50,043,791.25
දේශීය ආධාර - බොඩිලයින් (පෞද්) සමාගම	291,081.27	291,081.27
විදේශ ආධාර ලැබීම්	99,276,267.22	99,276,267.22
	392,576,595.91	**368,342,499.39**
සටහන 14		
ප්‍රත්‍යාගණන සංචිත		
2011.01.01 දිනට ශේෂය	15,485,218.74	15,485,218.74
2011.12.31 දිනට ශේෂය	**15,485,218.74**	**15,485,218.74**

	2011 රු.	2010 රු.
සටහන 15		
මෙහෙයුම් ආදායම්		
පරීක්ෂණ	43,941,457.97	36,321,111.17
පුහුණුකිරීම්	24,563,773.53	20,199,519.08
උපදේශක සේවා	952,985.00	1,441,200.00
සම්මන්ත්‍රණ	100,000.00	42,000.00
පාරිභෝගික/කාර්මික සේවා	1,079,910.75	189,903.00
අනෙකුත් ආදායම්	1,210,704.71	2,622,192.80
තජව වැඩි දියුණුකිරීමේ ව්‍යාපෘතියෙන් ලැබූ ලාභ	3,062,894.97	3,430,296.74
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතියෙන් ලැබූ ලාභ	1,012,500.00	-
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ ලාභය	2,209,924.75	-
	78,134,151.68	**64,246,222.79**
සටහන 16		
පුද්ගල පඩිනඩි		
වැටුප් හා වේතන (අන්තර් දීමනා ඇතුලුව)	23,287,894.34	22,030,013.66
ජීවන වියදම් දීමනාව	5,737,803.10	5,177,203.13
සේවක අර්ථසාධක අරමුදල	3,207,703.79	2,636,033.28
සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල	801,961.88	658,881.75
වැඩබැලීමේ දීමනා	202,682.50	-
සභාපති දීමනා	230,000.00	88,952.00
තාවකාලික වැටුප්/පුහුණු දීමනා	78,240.59	86,100.00
අතිකාල දීමනා	2,547,403.94	1,897,041.92
සති අන්ත දීමනා	3,001,733.14	2,359,101.11
ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	-	422,485.81
උපදේශන ගාස්තු	116,468.75	-
උපදේශක දිරි දීමනා	23,954.00	137,800.50
බැංකු ණය පොලි - සේවක	8,057.96	29,098.67
පාරිතෝෂික වෙන්කිරීම්	2,782,999.88	5,334,645.50
	42,026,903.87	**40,857,357.33**
සටහන 17		
ගමන් වියදම්		
දේශීය	436,209.00	320,260.50
විදේශීය	-	123,451.90
	436,209.00	**443,712.40**

	2011 රු.	2010 රු.
සටහන 18		
සැපයීම් හා පරිභෝජන වියදම්		
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	1,242,909.51	1,061,425.15
පුහුණුකිරීමේ අමුද්‍රව්‍ය	357,360.34	82,935.24
අනෙකුත් පරිභෝජන	2,764,481.70	471,819.40
තත්ව සහතික සහ බලයලත් නියෝජිත		
ආයතන සහතික	1,200,803.11	1,321,577.03
වාහන සහ විදුලි උත්පාදක සඳහා ඉන්ධන	1,333,327.69	905,693.45
	6,898,882.35	**3,843,450.27**
සටහන 19		
අළුත්වැඩියා සහ නඩත්තු වියදම්		
ඉඩම් සහ ගොඩනැගිලි	1,040,921.32	329,382.55
මෝටර් රථවාහන	1,107,066.95	682,186.39
ලි බඩු සවිකිරීම් සහ උපකරණ	179,455.05	93,800.98
පර්යේෂණාගාර උපකරණ	149,471.75	167,972.47
පිරියත සහ යන්ත්‍රෝපකරණ	353,015.17	301,293.56
පරිගණක	422,883.32	260,359.73
විදුලි උත්පාදක යන්ත්‍ර	68,913.70	417,146.82
	3,321,727.26	**2,252,142.50**
සටහන 20		
ගිවිසුම්ගත සේවා		
රක්‍ෂණ	212,451.53	316,952.96
ආරක්‍ෂක සේවා	1,631,659.46	1,173,120.00
සනිපාරක්‍ෂක සේවා	1,190,045.46	1,778,898.68
විදුලි වියදම්	5,968,179.32	4,829,227.67
ජලය - උපයෝගි සේවා	357,794.12	301,531.36
සන්නිවේදන සේවා	784,521.06	709,644.59
තැපැල් ගාස්තු	65,178.00	46,985.00
දැන්වීම් ගාස්තු	521,740.00	293,030.60
ප්‍රවාහන ගාස්තු	675,750.00	427,450.00
	11,407,318.95	**9,876,840.86**
සටහන 21		
අනෙකුත් මෙහෙයුම් වියදම්		
බාහිර දේශක ගාස්තු	1,051,856.67	470,592.00
විගණන ගාස්තු වෙන්කිරීම්	150,000.00	150,000.00
පුහුණු පාඨමාලා වියදම්	344,897.31	285,919.32
අනෙකුත් වියදම්	215,400.98	254,113.24
සේවක පුහුණුකිරීම් දේශීය	203,950.00	108,606.25
සේවක සුභසාධන - තේ වියදම්	288,230.00	238,059.00
සේවක වෛද්‍ය සුභසාධක යෝජනා ක්‍රමය	820,872.87	693,633.31
සුභසාධක සංගමය	50,000.00	50,000.00
බැංකු ගාස්තු	7,207.24	8,462.48

	2011	2010
	රු.	රු.
පාලක මණ්ඩල දීමනා	148,000.00	29,000.00
ප්‍රදර්ශන වියදම්	478,684.54	168,699.71
මුද්දර ගාස්තු	9,675.00	19,075.00
උපදේශක සේවා අනෙකුත් වියදම්	-	4,500.00
බොල් ණය වෙන්කිරීම්	213,996.30	218,328.75
දිවි නැගුම වැඩසටහන	59,828.00	-
ගෝස් පරීක්ෂා කිරීමේ ගාස්තු	77,950.00	40,975.00
ආර්ථික සේවා ගාස්තු	42,020.00	148,095.21
සහතික ප්‍රදාන උත්සවය	-	217,525.67
පාසැල් නිළ ඇඳුම් පරීක්ෂා කිරීමේ වියදම්	22,915.47	23,811.00
අධිභාර	-	311,686.71
රඳවාගැනීමේ බදු	-	2,936.00
ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	-	2,091.00
ටීජීසී සහ එම්ටීබී සාමාජික දීමනා	15,540.00	18,500.00
නීති ගාස්තු	40,000.00	61,000.00
විගණන සහ කළමණාකරන කමිටු දීමනා	36,000.00	-
වෘතිය සාමාජික ගාස්තු නිලධාරීන්/ආයතනය	39,787.04	40,340.26
වාර්ෂික අළුත්කිරීමේ ගාස්තු	68,198.32	47,912.41
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ව්‍යාපෘති වියදම්	-	93,893.48
ආහාරපාන සඳහා වියදම්	84,118.60	62,372.00
තත්ව පර්යේෂණාගාර ගාස්තු	-	4,800.00
ප්‍රකාශන සහ සඟරා	171,653.40	490,781.61
	4,640,781.74	**4,265,709.41**

<u>සටහන 22</u>

ක්ෂයවීම්		
ගොඩනැඟිලි	1,293,851.45	2,145,229.81
පරිගණක	2,138,894.31	1,600,636.89
ලී බඩු, සවිකිරීම් සහ උපකරණ	1,376,327.19	6,541,332.74
මෝටර් රථ	934,742.05	1,863,000.00
පිරියත සහ යන්ත්‍රෝපකරණ	714,290.57	667,772.49
කාර්මික මහන යන්ත්‍රෝපකරණ	1,727,536.31	1,730,536.31
පර්යේෂණාගාර උපකරණ	4,171,234.54	4,006,803.12
වීඩියෝ වැඩසටහන	68,013.75	38,326.25
පොත් සහ සඟරා	312,122.39	354,249.48
	12,737,012.56	**18,947,887.09**

	2011 රු.
<u>සටහන 23</u>	
<u>ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ ලාභ/අලාභ</u>	
<u>ලී බඩු, සවිකිරීම් සහ උපකරණ</u>	
පිරිවැය	2,708,901.58
අඩු කළා - සමුච්චිත ක්ෂය	2,707,371.58
	1,530.00
විකිණීමෙන් ලැබූ මුදල	312,549.92
ලාභය/(අලාභය)	(311,019.92)
<u>පරිගණක</u>	
පිරිවැය	6,354,720.90
අඩුකළා - සමුච්චිත ක්ෂය	6,354,720.90
	-
විකිණීමෙන් ලැබූ මුදල	31,594.52
ලාභය/(අලාභය)	31,594.52
<u>පිරියත සහ යන්ත්‍රෝපකරණ</u>	
පිරිවැය	8,000.00
අඩුකළා - සමුච්චිත ක්ෂය	8,000.00
	-
විකිණීමෙන් ලැබූ මුදල	1,333.33
ලාභය/(අලාභය)	1,333.33
<u>කාර්මික මහන යන්ත්‍ර උපකරණ</u>	
පිරිවැය	519,357.44
අඩුකළා - සමුච්චිත ක්ෂය	429,357.44
	90,000.00
විකිණීමෙන් ලැබූ මුදල	212,995.00
ලාභය/(අලාභය)	(122,995.00)
<u>මෝටර් රථවාහන</u>	
පිරිවැය	3,712,565.00
අඩුකළා - සමුච්චිත ක්ෂය	3,712,565.00
	-
විකිණීමෙන් ලැබූ මුදල	1,557,500.00
ලාභය/(අලාභය)	(1,557,500.00)
ඉවත් කරන අයිතමයන් විකිණීමෙන් ලැබූ මුදල	185,481.98
වත්කම්/ඉවත්කරන අයිතම විකිණීමෙන් ලැබූ ලාභ එකතුව	2,209,924.75

ක්‍රියාකාරකම් දැක්වෙන දර්ශක

සේවකයකුගේ ඉපයීම්



පුනරාවර්තන වියදම්



ආදායම/පුනරාවර්තන වියදම් - % (ක්ෂයවීම් හැර)



පුනරාවර්තන වියදම සඳහා මුදල් යෙදූ ආකාරය



මුල්‍ය ප්‍රකාශන වාර්තාව

ආදායම



සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය වාර්තා කල වාර්ෂික ආදායම රු. මිලියන 78.1 කි. මෙය 2010 වර්ෂය සමග සැසඳීමේදී 21.6% ක වැඩිවීමකි.

ක්‍රියාකාරී ආදායම



මෙහෙයුම් ආදායමෙන් 88.2% ක් තත්ව පරීක්ෂණ, පුහුණු කිරීම් සහ උපදේශක සේවා මගින් වන අතර ආයෝජන පොළී, සම්මන්ත්‍රණ, කාර්මික සේවා සහ විවිධ ක්‍රියාකාරකම් මගින් 3.8% ක්ද ආයතනය මගින් ක්‍රියාත්මක වූ තත්ව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැඩසටහන මගින් සහ ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ ලාභය මගින් 8% ක ලාභයක් උපයාගෙන තිබිණ. කෙසේ නමුත් තත්ව පරීක්ෂණ මගින් ලැබූ ආදායම මෙම වසරේදීත් අනෙක් වසර වල මෙන්ම ප්‍රධාන ආදායම් මාර්ගය විය.

පරීක්ෂණ ආදායම



මෙම වසර තුලදී ආයතනය විසින් පිරිවිතර 7,989 කින් පරීක්ෂණ 4,394 ක් මගින් රු. මිලියන 43.94 ආදායමක් ලැබීය. එය පසුගිය 2010 වසර සමග සැසඳීමේදී 21% ක වැඩිවීමකි.



පුහුණු කිරීම් සහ උපදේශක සේවා

පුහුණුකිරීම්, ආයතනයේ මූලික සේවාවක් වශයෙන් පවත්වාගෙන යනු ලබයි. ආයතනයේ වාර්තා අනුව 2011 වසරේදී පුහුණු පාඨමාලා 119 ක් පුහුණුවන්නන් 1,790 කගේ සහභාගිත්වයෙන් පවත්වා ඇත. පුහුණු පාඨමාලා මගින් ලැබූ ආදායම රු. මිලියන 24.56 ක් වූ අතර එය 2010 වසර සමග සැසඳීමේදී 21.8% ක වැඩිවීමකි.



උපදේශක සේවා මගින් ලැබූ ආදායම රු.මිලියන 0.48 කින් වැඩිවී ඇති අතර එය පසුගිය වසර සමග සැසඳීමේදී 34% ක අඩුවීමකි.

අනෙකුත් ක්‍රියාකාරකම් මගින් ලැබූ ආදායම

මුළු ආදායමට 3.8% ක් දායක වූ අනෙකුත් ආදායමෙහි ප්‍රධානතම ආදායම් මාර්ගය වූයේ 35% ක් වූ පාසැල් නිළ ඇඳුම් නිරීක්ෂණය කිරීමේ ගාස්තු වශයෙන් ලැබූ ආදායම වේ. ආයෝජන සඳහා ලැබූ පොලී ආදායම 24% ක්ද ප්‍රවාහන ගාස්තු වලින් ලැබූ 15% ක්ද ඉතිරි 26% ක්ද විවිධ ක්‍රියාකාරකම් මගින් ලැබුණි. සේවක ණය පොලී, ආපනශාලා කුලිය, දැයට කිරුළ ප්‍රදර්ශනයේ රෙදිපිළි විකිණීමෙන් ලැබූ මුදල් සහ කාර්මික සේවාවන් සැපයීමෙන් ලැබූ මුදල් මෙම විවිධ ක්‍රියාකාරකම් තුල ඇතුලත් වේ.

වියදම්

	2011 රු.මිලියන	2010 රු.මිලියන
මෙහෙයුම් ආදායම	78.13	64.25
<u>**අඩු කළා**</u>		
පරිපාලන හා පොදු වියදම්	(47.10)	(45.57)
මෙහෙයුම් හා නඩත්තු වියදම්	(21.63)	(15.97)
ක්ෂයවීම් වලට පෙර ශුද්ධ අතිරික්තය	9.40	2.71
<u>**අඩු කළා**</u>:		
වසරේ ක්ෂයවීම්	(12.74)	(18.95)
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන	-	7.50
ක්ෂයවීම් වලට පසු ශුද්ධ අතිරික්තය	(3.34)	(8.74)

මෙම වසර සඳහා මුළු පුනරාවර්තන වියදම රු. මිලියන 68.73 ක්වූ අතර පසුගිය වසරේ එය රු. මිලියන 61.54 ක විය. මෙය 11.7% ක වැඩිවීමකි. මෙම පුනරාවර්තන වියදම තුල පරිපාලන සහ පොදු වියදම්, මෙහෙයුම් සහ නඩත්තු වියදම් ඇතුලත් වේ.

ක්ෂයවීම් වලට පෙර අතිරික්තය රු. මිලියන 9.40 ක්වූ අතර රු.මිලියන 12.74 ක්වූ වසරේ ක්ෂයවීම් ඇතුලත් කිරීමෙන් පසු ඌණතාවය රු. මිලියන 3.34 ක් විය.

මූල්‍ය ව්‍යුහය

දේපළ පිරියත සහ උපකරණ වල ශුද්ධ අගය රු. මිලියන 82.47 කි. ගොඩනැඟිලි අළුතින් වැඩි දියුණු කිරීම, ලී බඩු සහ සවිකිරීම්, පිරියත සහ යන්ත්‍රෝපකරණ, රසායනාගාර උපකරණ, මෝටර් රථවාහන මිළදී ගැනීම සඳහා රු. මිලියන 22.01 ක් වසර තුලදී ආයෝජනය කරන ලදී.

මහා භාණ්ඩාගාරයෙන් 2011 වසර වෙනුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් රු.මිලියන 30 ක්ද අත්‍යන්ත්‍ර වර්ණ ගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා අප මව් අමාත්‍යාංශයෙන් රු.මිලියන 3 ක් ලැබුණි.

ජංගම වත්කම් රු. මිලියන 68.17 සිට රු. මිලියන 78.30 දක්වා වැඩි වී ඇත. මුදල් හා මුදලට සමාන දෑ රු. මිලියන 4.99 කින් වැඩි වී ඇත.

ද්‍රවශීලත්ව අනුපාතය (ජංගම වත්කම් ÷ ජංගම බැරකම්) 9 වාරයක් වූ අතර පසුගිය වසර හා සැසඳීමේදී එය 12 වාරයකි.

වසර තුලදී වූ සමුච්චිත අලාභය වෙනස්වීම ගණන් ගැනීමට පෙර සහභාග්‍ය සහ සංචිත ශේෂය දැක්වේ. පෙර වසර හා සැසඳීමේදී සහභාග්‍ය සහ සංචිත රු.මිලියන 20 කින් වැඩිවී ඇත්තේ ඉදිරියට ගෙන ආ සමුච්චිත අලාභය වූ රු.මිලියන 255න ගණනය කිරීමෙන් පසුවය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: එස්සි/බි/එස්එල්අයිටිඑච්/එෆ්ඒ/2011	ඔබේ අංකය / உமது இல / No.:	දිනය / திகதி / Date: 2012 අගෝස්තු 10 දින.

සභාපති,

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය.

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතන පනතේ 14 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை | No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி 2887220 | ෆැක්ස් අංකය / பெக்ஸ் இல / Fax No. 2887223 | ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் oaggov@sltnet.lk

කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජේෂකර්ම සහ ඇඟළුම් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී. ල. ගි. ප්‍ර. 03 ට අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් නිර්දේශ කරන්නේ නම් හෝ එසේ කිරීමට ඉඩ දෙන්නේ නම් හැර වත්කම් වගකීම් හිලව් කිරීම නොකල යුතු වුවත්, ඊට පටහැනිව වූ රු. 28,206 ක ණයගැති බැර ශේෂ 21 ක් ණයගැතියන්ගෙන් අඩු කර ගිණුම්වල පෙන්වා තිබුණි.

(ආ) ශ්‍රී. ල. ගි. ප්‍ර. අංක 18 ට අනුව දේපල පිරියත හා උපකරණ වර්ගයට අයත්වන වත්කම් යම් සාධාරණ කාලයකට වරක් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි.

2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රවර්තන වර්ෂයේ ආයතනයේ නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණු කටයුතු වෙනුවෙන් වැය වූ රු. 3,995,206 ක් පුනරාවර්තන වියදමක් ලෙස දක්වනු වෙනුවට ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කමක් ලෙස දක්වා තිබුණි.

(ආ) පරිගණක නඩත්තු වියදම්වලට අදාල වන අන්තර්ජාල ආරක්ෂිත මෘදුකාංග සඳහා වැය කර තිබූ රු. 60,000 ක මුදල ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

2.2.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිලධාරීන් දෙදෙනෙකුගේ 2011 දෙසැම්බර් 31 දිනට ආපදා ණය මුදල්, ආපදා ණය ලේඛනය අනුව හා අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කළ උපලේඛනය අනුව රු. 93,749 ක වෙනසක් පැවතුණි.

(ආ) 2011 දෙසැම්බර් 23 දින ඇඟළුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනයේ සහ පේෂකර්ම සහ සේවා මධ්‍යස්ථානයේ ඈවර කිරීමේ ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද ඉහත ආයතනවල 2009 සැප්තැම්බර් 01 දිනට අදාල ගිණුම් ශේෂයන් සහ 2010 මාර්තු 23 දින ඉදිරිපත් කරන ලද 2009 වර්ෂයට අදාල ඉහත සඳහන් ආයතනවල අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම් ශේෂයන් අතර රු.60,834 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, එම වෙනස මේ දක්වා නිරවුල් කර නොතිබුණි.

2.2.4 <u>ලැබිය යුතු ගිණුම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>ඵලදායිතා සංවර්ධන ව්‍යාපෘතිය</u>

ඇඟළුම් ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන ඇඟළුම් නිෂ්පාදන ආයතන වලින් මසකට රු. 5,000 බැගින් අයකර ගත යුතු වුවත්, ආයතන 18 කින් රු.265,000 ක මුදලක් ප්‍රවර්තන වර්ෂය අවසානයට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>වෙළඳ ණයගැතියන්</u>

ආයතනයේ සේවාවන් ණයට සැපයීමෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ රු.18,197,774 කින් රු. 3,070,692 ක් වසර 2 කට වැඩි කාල පරිච්ඡේදයක සිට හිඟ හිට පැවතුණි.

2.2.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

ගිණුම් විෂයය	අවසන් ගිණුම් අනුව වටිනාකම	තහවුරු නොවූ වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
	රු.	රු.	
• වෙළඳ ණයගැතියන්	18,197,774	18,156,770	ණය ගැති ශේෂ තහවුරු කිරීම්
• ස්ථාවර වත්කම්	310,415,933	253,555,739	භාණ්ඩ සමීක්ෂණ වාර්තා

2.2.6 **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**
(අ) **මුදල් රෙගුලාසි**	
මු. රෙ. 756	ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි.
(ආ) **චක්‍රලේඛ**	
(i) 2009 සැප්. 01 දිනැති අංක ඩීඑම්ඊ/2009/(2) දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛන සහ එමගින් නියම කර ඇති අනෙක් ලේඛන පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ගබඩා භාණ්ඩ සම්බන්ධ ඉන්වෙන්ට්‍රි ලේඛනද විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් වත්කම්වල ආරක්ෂාව, පැවැත්ම සහ වටිනාකම සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.
(ii) 1990 ඔක්තෝබර් 10 දිනැති හා අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ආයතනය සතු වාහනවල ඉන්ධන පාර්භෝජනය පිළිබඳ සෑම මාස 06 කට වරක්ම ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii)2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ ක්‍රියාකාරීත්වය තුලින් ජනිත වූ මූල්‍ය ප්‍රතිඵලය රු.3,334,684 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,740,877 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,406,193 කින් වර්ධනය වී ඇති අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම වැඩිවීම හා ක්ෂයවීම් අඩුවීම යන කරුණු විශේෂයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවය තවදුරටත් පැවතීම සඳහා පහත සඳහන් කරුණු බලපා තිබුණි.

විස්තරය	සමාලෝචිත වර්ෂය	පෙර වර්ෂය	වැඩිවීම	පූර්ව වර්ෂයට වඩා වැඩිවීමේ ප්‍රතිශතය
	රු.	රු.	රු.	%
සැපයීම් සහ පාරිභෝජන වියදම	6,898,882	3,843,450	3,055,432	79.50
අලුත්වැඩියා හා නඩත්තු වියදම්	3,321,727	2,252,142	1,069,585	47.49
ගිවිසුම්ගත සේවාවන්	11,407,319	9,876,841	1,530,478	15.49
පුද්ගල පඩිනඩි	42,026,904	40,857,357	1,169,547	2.86

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පේෂකර්ම සහ ඇඟළුම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා පුද්ගලයින් පුහුණු කිරීමද, පරීක්ෂණ සහ උපදේශන කාර්යයන් වැනි සේවාවන් ඉටු කිරීමද මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණු වේ. එම කාර්යයන් ඉටු කිරීමේ කාර්ය සාධනය ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

(අ) **පුහුණු කිරීම්**

	2011	2010	වැඩිවීම	වැඩිවීමේ ප්‍රතිශතය
(i) පාඨමාලා සංඛ්‍යාව	119	118	01	0.85%
(ii)සහභාගි වූ සංඛ්‍යාව	1,790	1,335	455	34%
(iii) පුහුණු පාඨමාලා ආදායම (රු. මිලියන)	24.56	20.20	4.36	22%

- සමාලෝචිත වර්ෂයේ පුහුණු පාඨමාලා ආදායම රු. මිලියන 25.3 ක් ඉලක්ක කර තිබුණද සත්‍ය වශයෙන් ලැබී තිබුණේ රු. මිලියන 24.6 ක් පමණි. එනම්, ආදායම 3% කින් අඩු වී තිබුණි.

- 2011 දෙසැම්බර් 31 දක්වා පැවැත්වීමට සැලසුම් කර තිබූ පාඨමාලා හා පැවැත්වූ පාඨමාලා සැසඳීමේදී පාඨමාලා 17 ක් පවත්වා නොතිබුණි.

- ඉහත පරිදි සැලසුම් කල පාඨමාලා නොපැවැත්වීම නිසා ආයතනයට ලැබිය හැකිව තිබූ විශාල ආදායමක් අහිමි වී තිබූ අතර, ආයතනය සතු මානව සහ භෞතික සම්පත් වලින් ලැබිය හැකිව තිබූ ප්‍රයෝජනද ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එසේම නඩත්තුව සඳහා වියදම් දැරීමටද සිදුවීම ඇහළුම් නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය පුහුණු ශ්‍රමය හිඟවීම මේ නිසා සිදුවන බව තවදුරටත් නිරීක්ෂණය විය.

- මෙම පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගිත්වය නොමැතිවීම මෙම පාඨමාලා නොපැවැත්වීමට හේතු ලෙස දක්වා තිබුණද, එම පාඨමාලාවලට සිසුන් ආකර්ෂණය කර ගැනීම සහ ප්‍රචාරණ හා වෙනත් ප්‍රවර්ධන උපාය මාර්ග අනුගමනය කර අදාල පාඨමාලාවලට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සපයා ගැනීම කළමනාකරණයේ වගකීමක් වේ.

(ආ) **පරීක්ෂණ**

පසුගිය වර්ෂය හා සැසඳීමේදී පහත සඳහන් පරිදි සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව 14% ඉහල යාමක් සමාලෝචිත වර්ෂයේදී නිරීක්ෂණය වුවද, එයට සාපේක්ෂව ආදායම 21% කින් වැඩි වී තිබුණි.

	2011	2010	වැඩිවීම	වැඩිවීමේ ප්‍රතිශතය
(i) පරීක්ෂණ සංඛ්‍යාව	43,864	38,562	5,302	14%
(ii) පරීක්ෂණ ආදායම (රු. මිලියන)	43.94	36.32	7.60	21%

(ඇ) උපදේශාත්මක සේවා

පසුගිය වර්ෂය හා සැසඳීමේදී පහත සඳහන් පරිදි උපදේශාත්මක සේවා සංඛ්‍යාව 5 කින් වැඩි වී තිබුණද, ඊට සාපේක්ෂව ආදායම 34% කින් අඩු වී තිබුණි.

	2011	2010	(අඩුවීම)/ වැඩිවීම	ප්‍රතිශතය
(i) උපදේශාත්මක සේවා සංඛ්‍යාව	18	13	5	38%
(ii)උපදේශාත්මක සේවා ආදායම (රු. මිලියන)	0.95	1.44	(0.49)	(34%)

(ඈ) සම්මන්ත්‍රණ

පසුගිය වර්ෂය හා සැසඳීමේදී සම්මන්ත්‍රණ ආදායම රු. මිලියන 0.058 කින් හෙවත් 138% කින් වැඩි වී තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ ගමන්

ප්‍රවර්තන වර්ෂයේදී විදේශ ගමන් වියදම් ලෙස රු.3,778,669 ක් වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) විදේශ ගමන් වලට අදාල සියලු විස්තර ඇතුලත් විධිමත් ලිපිගොනුවක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ii) එක් එක් නිලධාරීන්ගේ රාජකාරී විදේශ ගමන් වලට අදාල තොරතුරු එම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවල ඇතුලත් කර නොතිබුණි.

(iii) 2010 ජූලි 09 දිනැති ජනාධිපති කාර්යාල චක්‍රලේඛයට අනුව රජයේ නිලධාරීන් විදේශ නිල සංචාරයක යෙදී ආපසු දිවයිනට පැමිණීමෙන් පසු දින 7 ක් ඇතුලත වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත්, ආයතනයේ නිලධාරීන් එවැනි වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පිරිස් කළමනාකරණය

2009 අංක 12 දරණ පාර්ලිමේන්තු පනතින් ඇඟළුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය සහ රේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය 2009 සැප්තැම්බර් 01 දින සිට එක් ආයතනයක් ලෙස ඒකාබද්ධ කර තිබුණු බැවින් අළුතින් පිහිටුවන ලද ආයතනයේ නිලධාරීන් ඇතුළු සේවක මණ්ඩලය සඳහා අළුතින් පත්වීම් ලිපි ප්‍රදානය කල යුතු වුවත්, ප්‍රවර්තන වර්ෂය අවසානයටත් එසේ කර නොතිබුණු අතර නව ආයතනයේ නිලධාරීන් පැරණි ආයතන දෙකෙහි තනතුරු නාමවලින් තවදුරටත් රාජකාරී කටයුතු සිදු කර ගෙන යනු ලබන අතර, ප්‍රතිව්‍යුහකරණයේදී සිදු වූ තනතුරු නාම සංශෝධන සමාලෝචිත වර්ෂය අවසානයටත් ක්‍රියාත්මක කර නොතිබුණි.තවද ප්‍රතිව්‍යුහකරණය කරන ලද සමස්ථ කාර්යය මණ්ඩලයට අදාල තනතුරු සඳහා බඳවා

ගැනීමේ හා උසස්වීමේ පටිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගත යුතු වුවත්, එසේ කර නොතිබුණි.

4.3 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී රු. 2,971,175 ක් වැයකර මිලදී ගන්නා ලද පරිගණක 25 ක්, රු.126,100 ක් වැය කර මිලදී ගන්නා ලද පරිගණක පුටු 26 ක් සහ රු.184,063 ක් වැයකර මිලදී ගන්නා ලද පරිගණක මේස 26 ක් වර්ෂය අවසානය දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ පුහුණු පාඨමාලාවලට අදාල පන්ති පැවැත්වීමට ඉඩකඩ නොමැති තත්වයන් තිබුණද, 2012 අප්‍රේල් 30 දිනට රු. මිලියන 6 කට වැඩි මුදලක් වැය කර ඉදිකල පන්ති කාමර ගොඩනැගිලිවල ඉතිරි සුළු ඉදිකිරීම් වැඩ නිම නොකිරීම නිසා වසර 2 කට ආසන්න කාලයක සිට ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(ඇ) රු. 1,948,016 ක් වටිනා අමතර කොටස් තොග වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන පොත්වලින් ඉදිරියට ගෙන එමින් තිබුණි.

4.4 **ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **විදුලි බල නවීකරණය කිරීම**

ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි ගාස්තු ගෙවන රේටයන් වාණිජ පදනමේ සිට කර්මාන්තශාලා පදනමට මාරු කිරීමේ අරමුණින් ආයතනයේ විදුලි බල සැපයුම නවීකරණය කිරීම සඳහා ප්‍රවර්තන වර්ෂය අවසානයට රු.6,133,865 ක් වැයකර තිබුණද, මෙම ආයතනය කර්මාන්තශාලා අංශයට අයත් නොවන නිසා විදුලි ගාස්තු ගෙවන රේටයන් වාණිජ පදනමේ සිට කර්මාන්තශාලා පදනමට මාරු කිරීමට නොහැකි බව විදුලි බල මණ්ඩලය පවසා තිබුණි.

(ආ) 2007 වර්ෂයේදී සහතික පත්‍ර නිකුත් කිරීමේ ඒකකයක් (Certification Unit) පිහිටුවා ඒ සඳහා රු. 189,000 ක මුදලක් වැය කර තිබුණද, ප්‍රවර්තන වර්ෂය තුලදීද අදාල කාර්යයන් හා අදාල අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) නූල් වර්ණ ගැන්වීමේ ව්‍යාපාතියට භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් ප්‍රවර්තන වර්ෂයේදී ලබාදුන් රු. මිලියන 11 ක මුදලින් රු.8,142,918 ක් වැය කර නූල් වර්ණ ගැන්වීමේ යන්ත්‍ර හා ඊට අදාල උපකරණ මිලදී ගෙන තිබුණද, යන්ත්‍ර මිලදී ගැනීමට පෙර ඊට අවශ්‍ය ත්‍රී ෆේස් විදුලිය සහ ගොඩනැගිලි පහසුකම් සපයා ගැනීම කෙරෙහි ආයතනය අවධානය යොමු කර නොතිබීම නිසා මෙම යන්ත්‍ර නිෂ්කාර්යව පැවතුණි.

4.5 හඳුනා ගන්නා ලද පාඩු

කොන්ත්‍රාත් පදනම මත වර්ෂයක් සඳහා සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් 7 දෙනෙකුගේ සේවය මාස 3 කට පසු නතර කිරීම නිසා එම නිලධාරීන් විසින් ගොනු කර තිබූ නඩුවෙන් ආයතනය පරාජය වී වැටුප් ලෙස රු.420,000 ක් සහ නඩු ගාස්තු ලෙස රු.49,800 ක් ගෙවීමට සිදු වී තිබුණි.

4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

මායිම් තාප්පය සහ ආරක්ෂණ මුරකුටිය ඉදි කිරීමට අදාල කොන්ත්‍රාත්තුව 2011 අප්‍රේල් 27 දින රු.1,518,559 ක මුදලකට පිරිනැමූ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු 2011 සැප්තැම්බර් 29 දිනට පෙර නිමකල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.

4.7 සේවක පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩ නැගීම

ශේෂ පත්‍රය අනුව ප්‍රවර්තන වර්ෂය අවසානයට සේවක පාරිතෝෂික දීමනා සඳහා රු.මිලියන 22.75 ක වෙන් කිරීමක් සිදු කර තිබූ නමුත්, එම මුදලින් රු.මිලියන 12.75 ක මුදලක් ආයෝජනය කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනයේ ක්‍රියාකාරිත්වය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රවර්තන වර්ෂය සඳහා විගණන වැඩ සටහනක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක වරයාට පවරා තිබූ අතර, කිසිදු ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් විගණනයක් ප්‍රවර්තන වර්ෂය තුලදී සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද, කිසිදු විගණන විමසුමක්ද නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) තොග හා වත්කම් සත්‍යාපනය

(ඇ) වාහන නඩත්තුව හා පාලනය

(ඈ) ගබඩා පාලනය

(ඉ) ලැබිය යුතු ගිණුම්

(ඊ) වත්කම් මිලදී ගැනීම

(උ) ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු

(ඌ) පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම

එච්. ඒ. එස්. සමරවීර

විගණකාධිපති